ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරන සහතික පත්‍ර වැඩසටහන
අවසාන පරීක්ෂණය 2008/2009

## ගිණුම්කරණය හා මූල්‍ය හැඳින්වීමක් – MCC 1206

| දිනය : 2008 දෙසැම්බර් 21 | වේලාව : ප.ව.1.30 ප.ව. 3.30 |
|---|---|

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ 4 කට පිළිතුරු සපයන්න.**
**වැඩ සටහන් ගත නොකළ ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලැබේ'**

**01.**
පහත සඳහන් තොරතුරු "මහේෂ් ට්‍රේඩර්ස්" ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගෙන ඇත.

2007 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම

| විස්තරය | හර (රු) | බැර (රු) |
|---|---|---|
| බොල්ණය | 3,000 | |
| රක්ෂණය | 18,000 | |
| ලද කොමිස් | | 20,000 |
| 2007.01.01 දිනට බඩු තොගය | 28,000 | |
| බැංකු ගාස්තු | 5,000 | |
| මුදල් සහ බැංකු | 36,000 | |
| ඉඩම් සහ ගොඩනැගිලි /2007.01.01 දිනට සමුච්චිත ක්ෂය | 850,000 | 350,000 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් /2007.01.01 දිනට සමුච්චිත ක්ෂය | 400,000 | 180,000 |
| ඇසුරුම් වියදම් | 6,000 | |
| ආපසු එවුම් | 6,500 | |
| ආපසු යැවුම් | | 8,000 |
| ණය ගැතියෝ | 43,000 | |
| ණය හිමියෝ | | 56,000 |
| 12% බැංකු ණය | | 220,000 |
| ගෙවූ බැංකු ණය පොලී | 13,000 | |
| දුන් වට්ටම් | 8,000 | |
| ලද වට්ටම් | | 10,000 |
| වැටුප් | 25,000 | |
| ප්‍රචාරණය | 18,000 | |
| ගැණුම් | 860,000 | |
| විකුණුම් | | 1,480,000 |
| ගැනිලි | 27,000 | |
| දුරකථන ගාස්තු | 15,000 | |
| නීති ගාස්තු | 18,000 | |
| ආයෝජන (8%) | 320,000 | |
| ලැබූ ආයෝජන ආදායම් | | 18,000 |
| ගෙනල්මේ කුලී | 7,000 | |
| මහේෂ් යෙදූ ප්‍රාග්ධනය | | 364,500 |
| | 2,706,500 | 2,706,500 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

- රු. 2,000/= ක් වටිනා ඇසුරුම් ද්‍රව්‍ය ඉදිරි වර්ෂය (2008) සඳහා භාවිතා කළ හැකිය.
- ශේෂ පිරික්සුමේ දක්වා ඇති රක්ෂණ වියදම්වල මහේෂ් මහතාගේ බිරිඳගේ ජීවිත රක්ෂණ වාරිකය වූ රු.3,500/= ක මුදලක් ද ඇතුලත්ය.
- 2007 දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු දුරකථන ගාස්තුව රු.1,500/= ක් තවම ගෙවා නැත.
- ගොඩනැගිලි වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් වාර්ෂිකව 5% බැගින් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ජංගම නොවන වත්කම් සඳහා 2007 වර්ෂයට අදාලව ක්ෂය වෙන් කළ යුතුය.
- බැංකු ණය හා ආයෝජන ශේෂය 2007 වර්ෂය ආරම්භයේ සිට ව්‍යාපාරයේ ලෙජරයේ දක්වා තිබුණි. 2007 වර්ෂය සඳහා බැංකු ණය පොලිය ගෙවිය යුතු අතර, 2007 වර්ෂය සඳහා ආයෝජන ආදායම් ලැබිය යුතුව ඇත.
- 2007/12/31 දිනට බඩු තොගයේ වටිනාකම රු. 18,000/= ක් ලෙස අගය කර ඇත.
- ශේෂ පිරික්සුමේ දක්වා ඇති මුළු ණය ගැතියන්ගෙන් රු. 2,000/= ක් බොල්ණය ලෙස ලියා හැරිය යුතු අතර, අඩමාන ණය වෙන් කිරීම ඉතිරි ණය ගැතියන්ගෙන් 5% ක් විය යුතුය.

ඔබ විසින් "මහේෂ් ට්‍රේඩර්ස්" ව්‍යාපාරයේ පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

- 2007/12/31 න් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම
- 2007/12/31 දිනට ශේෂ පත්‍රය. (ලකුණු 40 )

02.
රුබන් දේශීය වෙළඳපොල සඳහා අයිස් ක්‍රීම් නිෂ්පාදනය කරයි. අයිස් ක්‍රීම් නිෂ්පාදනය සම්බන්ධව 2007/12/31 න් අවසන් වර්ෂයට අදාලව පහත සඳහන් තොරතුරු සපයා ඇත.

පලතුරු රසකාරක සහ සීනි රු. 125,000/=
වෙනත් වක්‍ර අමුද්‍රව්‍ය රු. 12,000/=
විදුලි වියදම් රු.24,000/= (20% ක් පරිපාලන වියදම්වලට අදාල වේ.)
ඍජු වැටුප් රු.72,000/=
ගොඩනැගිලි කුලී රු.12,000/= (ගොඩනැගිල්ලෙන් 50% ක කර්මාන්ත ශාලාව පිහිටා ඇත.)
2007.01.01 දිනට අමුද්‍රව්‍ය තොගය රු. 15,000/=
2007.12.31 දිනට අමුද්‍රව්‍ය තොගය රු. 12,000/=
සුපරීක්ෂක වැටුප් රු.20,000/=
නොනිමි වැඩ 2007.01.01 දිනට රු. 16,000/=
නොනිමි වැඩ 2007.12.31 දිනට රු. 8,000/=
යන්ත්‍ර ක්ෂය රු.16,500/=
අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලී රු.3,000/=

ඉහත තොරතුරු ඇසුරින්

(a) 2007/12/31 න් අවසන් වර්ෂය සඳහා රුබන්ගේ නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

(b) 2007 වර්ෂය සඳහා රුබන් විසින් අයිස් ක්‍රීම් ඒකක 30,000 ක් නිෂ්පාදනය කළහොත් අයිස් ක්‍රීම් ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(c ) අයිස් ක්‍රීම් නිෂ්පාදනයෙන් 30% ක් ලාභ අපේක්ෂා කරන්නේ නම් අයිස් ක්‍රීම් බඳුනක (Cup) විකුණුම් මිල ගණනය කරන්න.

(ලකුණු 20)

03.
ජීවන් විසින් 2007 අප්‍රේල් 01 දින මුද්‍රණාලයක් ආරම්භ කරන ලදි. ඔහුගේ ව්‍යාපාරයේ පළමු මාසය තුල සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| 2007/04/01 | ජීවන් මුදලින් රු.200,000/= තම ව්‍යාපාරයේ ආයෝජනය කල අතර රු.150,000 ක් වටිනා මුද්‍රණ උපකරණද ව්‍යාපාරයට යෙද වීය. |
| 2007/04/03 | රු.25,000/= ක මූලික තැන්පතුවකින් ලංකා බැංකුවේ ගිණුමක් ආරම්භ කලා. |
| 2007/04/07 | රු.38,000/= ක් වටිනා මුද්‍රණ උපකරණ අත්පිට මුදලට මිලදී ගත්තා. |
| 2007/04/12 | මුද්‍රණ සේවා සැපයීමෙන් ලැබූ මුදල රු. 15,000/= |
| 2007/04/15 | පරිපාලන වියදම් ගෙව්වා රු. 2,700/= |
| 2007/04/17 | ජීවන් මහත්මියගේ දුරකථන බිල ව්‍යාපාරයේ මුදලින් ගෙව්වා රු. 2,000/= |
| 2007/04/18 | මුද්‍රණ සේවා සැපයීමෙන් ලැබූ මුදල රු. 15,000/= |
| 2007/04/20 | ලාල්ගෙන් මුද්‍රණ උපකරණ ගත්තා රු.13,000/= |
| 2007/04/22 | සපයන ලද මුද්‍රණ සේවා සඳහා ගනුදෙනු කරුවන්ගෙන් ලැබිය යුතු මුදල රු.18,000/= |
| 2007/04/25 | ලාල් වෙත ගෙවිය යුතු මුළු මුදල පියවීමට රු.12,000/= ක් ගෙව්වා. ලද වට්ටම රු.3,000/= |
| 2007/01/29 | ණය ගැතියන්ගෙන් ලැබිය යුතු රු.18,000/= ක ණය මුදල පියවීමට රු.16,500/= ක් ලැබුනා. ඉතිරි මුදල දුන් වට්ටම් ලෙස සලකන ලදි. |
| 2005/01/31 | ජීවන් රු.3,000/= ක් වටිනා මුදල්ද රු.4,500/= ක් වටිනා අලුත්වැඩියා කල හැකි මුද්‍රණ උපකරණද පුද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ලබා ගත්තා. |

ජීවන්ගේ ව්‍යාපාරයේ පළමු මාසය තුළ සිදු කරන ලද එක් එක් ගනුදෙනුව පහත දැක්වෙන සමීකරණය ඇසුරින් පෙන්නුම් කරන්න.

ප්‍රාග්ධනය + දිගුකාලීන වගකීම් + ජංගම වගකීම් = ස්ථාවර වත්කම් + ජංගම වත්කම්

(ලකුණු 20)

04.

i ව්‍යාපාර සංවිධානයක් විසින් පවත්වා ගෙන යනු ලබන විවිධ වර්ගවල උපයෝගී පොත් පිළිබඳව විස්තර කර ඒවා පවත්වා ගෙන යාමේ වාසි සඳහන් කරන්න.

ii "මුදල් අයවැය ලේඛනය" හා "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" එකිනෙකට සමානවේද නැතහොත් එකිනෙකට වෙනස්වේද? සාකච්ඡා කරන්න.

iii කුඩා ව්‍යාපාරිකයෙකුට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගත හැකි විවිධ මූලාශ්‍ර මොනවාද? ඒවා විස්තර කරන්න.

iv ඕනෑම ගිණුම්කරන අනුපාත තුනක් විස්තර කර එක් එක් අනුපාතය ගණනය කිරීමේ වාසි සඳහන් කරන්න.

(ලකුණු 20)

05.
පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම පහක් (05) පිළිබඳව කෙටි සටහන් ලියන්න

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

(a) ද්විත්ව සටහන් න්‍යාය
(b) සුළු මුදල් පොත් ක්‍රමය
(c) බැංකු සැසඳුම් ප්‍රකාශනය
(d) ක්‍රියාවලි පිරිවැයකරණය
(e) සමච්ඡේදන ලක්ෂය
(f) ව්‍යාපෘති ඇගයීමේ ක්‍රම

(ලකුණු 20)

\- හිමිකම ඇවිරිණි -